(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

**අංක. 217.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2012 ඔක්තෝබර් මස 23 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1883/'11

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි හුංගම, ගජමන්ගම උස්සාන ජල ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමා ඇති බවත්;

(ii) එම නිසා එකී ප්‍රදේශයේ ජනතාව දැඩි පීඩාවට පත්ව ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදුකිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, එම ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2147/'11

2.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, මහව නගරයේ ජල අවශ්‍යතා සපුරාලීම සඳහා 2005 වර්ෂයේ අග භාගයේදී ඉදිකරන ලද මහව ජල සම්පාදන ක්‍රමය ජනතා අයිතියට පත් කරන ලද දිනය කවරේද;

(ii) එහි ධාරිතාව කොපමණද;

(iii) ඒ යටතේ ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ජල සම්පාදන ක්‍රමය සඳහා ඇස්තමේන්තුගත මුදල හා වියදම් වූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉදිකිරීම් සිදු කරන ලද අය කවුරුන්ද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කළ අය කවුරුන්ද;

(iv) එහි වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2195/'11

3.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී, ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවට අදාළව,

(i) යොදවන ලද සමස්ත ප්‍රාග්ධනය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) කොටස් මත ලද ආදායම් සහ වත්කම් මත ලද ආදායම් ප්‍රමාණයන් කොපමණද;

(iii) කාර්ය මණ්ඩලයෙහි සමස්ත සේවක සංඛ්‍යාව සහ එක් සේවකයෙකු වෙනුවෙන් වැයවන මුළු මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) ඉහත තොරතුරු පෞද්ගලික අංශයේ බැංකු ආයතනයක් හා සන්සන්දනාත්මකව කොපමණද;

(v) පුනරාවර්තන නොවන වියදම් කොපමණද;

(vi) බදු සහ තීරු බදු ලෙස රජයට ගෙවන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(vii) ලාභය හෝ අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2225/'12

4.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ ''සැමට නිවසක් - හිතට සෙවණක්'' වැඩපිළිවෙළ යටතේ, විශ්වවිද්‍යාල ප්‍රජාවේ නිවාස අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා නිවාස 5000ක් ඒ ඒ විශ්වවිද්‍යාල අවට ඉදිකරදීමට හෝ ඒ සඳහා සුදුසු ඉඩම් කැබැල්ලක් ලබා දීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත වැඩ සටහන සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(ii) එසේ නම්, වෙන් කළ මුළු මුදල කොපමණද;

(iii) එම ප්‍රතිපාදන වෙන්කර ඇත්තේ නිවාස ඉදිකිරීමටද; නොඑසේ නම්, ඉඩම් කැබලි ලබා දීමටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2293/'12

5.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) යුද ජයග්‍රහනයෙන් පසු උතුරු - නැගෙනහිර ප්‍රදේශවල අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) යුද්ධයෙන් පසු උතුරු - නැගෙනහිර ප්‍රදේශවල අධ්‍යාපන සංවර්ධනය සඳහා,

(i) ආධාර ලබාදුන් විදේශීය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන කවරේද;

(ii) එම එක් එක් ආයතනය මගින් ලබාදී ඇති මූල්‍යමය ආධාරවල වටිනාකම වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2009 - 2012 දක්වා රජය විසින් වාර්ෂිකව කරන ලද මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම අදාළ ව්‍යාපෘති අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2490/'12

6.

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොස්ගම, වයි. එච්. මිනෝලි මහත්මිය සෞදි අරාබියේ, රියාද් නගරයෙහි, අර්කා පැලස්හි සේවයේ යෙදී සිටියදී මියගොස් ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මිනෝලි මහත්මියගේ මරණයට හේතුව මේ වනවිට හෙළිවී තිබේද;

(ii) එම හේතුව මරණ පරීක්ෂණ වාර්තාවකින් තහවුරුවී තිබේද;

(iii) ඇයගේ මරණය වෙනුවෙන් මේ වනවිට ඇයගේ ස්වාමිපුරුෂයා ඇතුළු ඥාතීන්ට වන්දි මුදලක් හෝ කිසියම් දීමනාවක් ලබා දීමට කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2492/'12

7.

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ වැලි ගොඩ දැමීම සඳහා බලපත්‍ර ලබාදී තිබේද;

(ii) එසේ නම්, ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) එම බලපත්‍රලාභීන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ඔවුන්ට වැලි ගොඩදැමීමට අවසර දී ඇති ස්ථාන කවරේද;

(v) අදාල බලපත්‍රලාභීන් විසින් වැලි ගොඩ දැමීමේදී අනුගමනය කළයුතු කොන්දේසි තිබේද;

(vi) එසේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2524/'12

8\.

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 වර්ෂය තුළදී පළමු වසරට පාසල් සිසුන් ඇතුළත් කරගැනීම, පෙළපොත් බෙදාදීම, නිල ඇඳුම් බෙදාදීම, 5 වසර ශිෂ්‍යත්වය සමත් වූ දරුවන්ට සහතික බෙදාදීම හා සපිරි පාසල් ව්‍යාපෘතිය ආරම්භ කිරීම යන කටයුතුවලට අදාළ එක් එක් ජාතික උත්සවය,

(i) පැවැත්වූ දිනය කවරේද;

(ii) පැවැත්වූ ස්ථානය කවරේද;

(iii) පැවැත්වීමට වැය කළ මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) හි සඳහන් සියලු ජාතික උත්සව පැවැත්වීමට වැය කළ මුළු මුදල කොපමණද;

(ii) එම මුදල් සපයාගත් ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2546/'12

9\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා යුද හමුදාවට, ගුවන් හමුදාවට සහ නාවික හමුදාවට ආහාර සැපයීම සිදුකරනු ලබන පුද්ගලයන් හා ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම පුද්ගලයන් හා ආයතන තෝරා ගැනීමේදී ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේද;

(iii) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද පුද්ගලයන් හා ආයතන කවරේද;

(iv) එම එක් එක් පුද්ගලයා හෝ ආයතනය විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් කවරේද;

(v) තෝරාගනු ලැබූ පුද්ගලයන් හා ආයතන විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2850/'12

10\.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සම්බා සහ නාඩු වී කිලෝවක් සඳහා මේ වන විට ගෙවනු ලබන රජයේ සහතික මිල වෙන් වෙන් වශයන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්තමානයේ වී කිලෝවක නිෂ්පාදන පිරිවැය කොපමණද;

(ii) එම පිරිවැය ගණනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නිෂ්පාදන වියදමට සාපේක්ෂව වී කිලෝවක් සඳහා ප්‍රමාණවත් සහතික මිලක් ගොවියාට ලබා දෙන්නේද;

(ii) නොඑසේ නම්, වී මිලදී ගන්නා සහතික මිල වැඩි කිරීමට ගන්නා ඉදිරි පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2883/'12

11.

ගරු මනූෂ නානායක්කාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2012 වර්ෂයේ දී ගාල්ල අධ්‍යාපන කලාපයේ පිහිටි ජාතික පාසල්වල,

(i) පළමුවැනි ශ්‍රේණියේ සිට දහතුන්වැනි ශ්‍රේණිය දක්වා පන්තිවල ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව එක් එක් පන්තිය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පළමුවැනි ශ්‍රේණියට සම්මුඛ පරීක්ෂණයෙන් සමත් සිසුන් හැර වෙනත් සිසුන් ඇතුළත් කොට තිබේද;

(iii) පළමුවැනි ශ්‍රේණියට එසේ ඇතුළත් කර ඇති එම සිසුන් කවුරුන්ද;

(iv) පළමුවැනි ශ්‍රේණියට හැර අනෙකුත් ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කර තිබේද;

(v) අනෙකුත් ශ්‍රේණි සඳහා ඇතුළත් කර ඇති එම සිසුන් කවුරුන්ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත පාසල් සඳහා සම්මුඛ පරීක්ෂණයන්ගෙන් සමත් වන සිසුන් හැර වෙනත් සිසුන් ඇතුළත් කිරීම සඳහා බලය පැවරූ නීත්‍යානුකූල ලිපි ලේඛන තිබේද;

(ii) එකී ලිපි ලේඛන මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1884/'11

12.

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය සභා කාර්යාල භූමියෙහි පිහිටි ආයුර්වේද බෙහෙත් ශාලාවේ පවතින ඖෂධ හිඟය නිසා ප්‍රදේශයේ ජනතාව දැඩි අපහසුතාවට පත්ව සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම බෙහෙත් ශාලාවේ පවත්නා ඖෂධ හිඟය කඩිනමින් මහහැරවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2148/'11

13\.
ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ලොතරැයි මණ්ඩලයට 2005 වර්ෂයේ සිට මේ දක්වා කාලසීමාව තුළ බඳවා ගෙන ඇති සේවක සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වන විට එහි පවතින සේවක අතිරික්තය හෝ සේවක ඌනතාවය කොපමණද;

(iv) අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයින් බඳවාගෙන තිබේ නම්, එයට හේතු කවරේද;

(v) අතිරික්ත සේවකයින් බඳවා ගැනීමට අනුමතිය ලබා දුන් බලධරයාගේ නම සහ තනතුර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2196/'11

14\.
ගරු රවී කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2011 දී රජය විසින් කොළඹ දිස්ත්‍රික්කය තුළ ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) 2012, 2013 සහ 2014 යන වර්ෂයන්හි දී ඉදිකිරීමට අපේක්ෂිත නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත සඳහන් නිවාස ඉදිකිරීම සඳහා වෙන් කොට ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අලුතින් ඉදිකරන ලද නිවාස නොමිලේ ලබා දෙන්නේද;

(ii) නොඑසේ නම්, එම නිවාස අලෙවි කරනු ලබන හෝ කුලියට දෙනු ලබන මිල ගණන් කවරේද;

(iii) එම නිවාස ලබා දෙන පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2226/'12

15\.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, ජල්තර, එඩ්මන්ටන් සහ ටොරින්ටන් නිවාස යෝජනා ක්‍රම වැනි

රාජ්‍ය සේවා නිවාස යෝජනා ක්‍රම 25ක් සෑම දිස්ත්‍රික්කයකම ප්‍රධාන නගරය පදනම් කරගෙන, එම දිස්ත්‍රික්කයේ සේවය කරන නිවාස නොමැති රජයේ සහ රාජ්‍ය සංස්ථා සේවකයින් වෙනුවෙන් ආරම්භ කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව ප්‍රකාරව නිවාස ව්‍යාපෘති ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වනවිට නිවාස ව්‍යාපෘති ඉදිකර අවසන්කර ඇති නගර සංඛ්‍යාව කොපමණද;

(iii) එම නගර කවරේද;

(iv) ඉදිකිරීම් අවසන් නිවාසවල පදිංචිකර ඇති රජයේ සහ සංස්ථා සේවක පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 7.00 දක්වා විය යුතුය. අ. භා. 4.00 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 2 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියෝග,— (469 වැනි අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 71 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 30 වැනි වගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 සැප්තැම්බර් 6 දිනැති අංක 1774/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.10.11 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— 2011.08.15 දින සිට පත් කරනු ලැබූ වත්මන් විගණකාධිපතිවරයා වන එච්. ඒ. එස්. සමරවීර මහතාගේ වැටුප ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව අනුව පහත සඳහන් පරිදි විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

විගණකාධිපති එච්. ඒ. එස්. සමරවීර මහතා එම තනතුරට පත්කළ 2011.08.15 වැනි දින සිට SL- 4 - 2006 වැටුප් පරිමාණයේ 2 වැනි පියවර වන රු.48,940.00 පියවරේ පිහිටුවා වැටුප් ගෙවීම, තනතුරට හිමි අනෙකුත් දීමනා ගෙවීම සහ වැටුප් පරිමාණයේ සඳහන් පරිදි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම කළයුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

දිවිනැගුම පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2009,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්ති යටතේ 2011.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද 2009.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2011.11.03 දින සලකා බලන ලදි.)

*9.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහල, සීදූව වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971

අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2011.02.24 වැනි දින ඉදිරිපත් කරන ලද 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2011.04.05 දින සලකා බලන ලදි.)

*10.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2009,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2011.11.11 වැනි දින ඉදිරිපත් කරන ලද 2009.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2012.06.19 දින සලකා බලන ලදි.)

*11.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2009,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2011.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද, 2009.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2011.11.03 දින සලකා බලන ලදී.)

*12.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2010,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2012.06.07 වැනි දින ඉදිරිපත් කරන ලද 2010.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2012.06.19 දින සලකා බලන ලදි.)

*13.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."
යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*16.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වැනි) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

17.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

18.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

19.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

20.

චන්දිම වීරක්කොඩි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

21.

නිමල් සිරිපාල ද සිල්වා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**